ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2341/50 - 2023 ජූලි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2023.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2023 අංක 8 දරන ගුවන් ප්‍රවාහන (සංශෝධන) පනත**

5 වැනි වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ නියමය

2023 අංක 8 දරන ගුවන් ප්‍රවාහන (සංශෝධන) පනතේ 5 වැනි වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා විසින්, මේ නියමය මගින්, ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනයක් නොවන ගුවන් ප්‍රවාහනයක දී, මෙහි උපලේඛනයේ II වන තීරුවේ දක්වා ඇති වගකීම්වලට සීමාවන් මෙම උපලේඛනයේ I වන තීරුවේ දක්වා ඇති වගන්තිවල කාර්යය සඳහා වන වගකීම්වලට සීමාවන් විය යුතු බවට නිශ්චිතව ම දක්වමි.

නිමල් සිරිපාල ද සිල්වා,
වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍ය.

2023 ජූලි මස 20 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

| *අංකය* | *I වන තීරුව*<br>*වගන්තිය* | *II වන තීරුව*<br>*වගකීම්වලට සීමාවන් (ශ්‍රී ලංකා රුපියල්)* |
|---|---|---|
| 1. | 21 වන වගන්තිය - මගියෙකු මිය යාම හෝ තුවාල සිදුවීමක් සම්බන්ධයෙන් | එක් එක් මගියා සඳහා 5,000,000 |
| 2. | 22 වන වගන්තිය, 1 වන ඡේදය - පුද්ගලයන් ප්‍රවාහනයේ දී ප්‍රමාදවීම් වලින් සිදු විය හැකි හානි සම්බන්ධයෙන් | එක් එක් මගියා සඳහා 10,000 |
| 3. | 22 වන වගන්තිය, 2 වන ඡේදය - ගමන් බඩු ප්‍රවාහනයේ දී ඒවා විනාශ වීම, නැතිවීම, හානිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධයෙන් | එක් එක් මගියා සඳහා 5,000 |
| 4. | 22 වන වගන්තිය, 3 වන ඡේදය - බඩු ප්‍රවාහනයේ දී ඒවා විනාශ වීම, නැති වීම, හානි වීම හෝ ප්‍රමාදවීම සම්බන්ධයෙන් | කිලෝ ග්‍රෑම් එකක් සඳහා 100 |

EOG 07 - 0193

1A - G 39937 — 56 (2023/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*